මාධ්‍ය නිවේදන අංක 15

මැතිවරණ කොමිෂන් සභාව

**පාර්ලිමේන්තු මැතිවරණය - 2020.04.25**

**දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම් සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයන් සඳහා කෙරෙන දැනුම් දීමයි**

- තරග කරන යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් පවත්වාගෙන යනු ලබන මැතිවරණ ප්‍රචාරක කාර්යාල, වෙනත් පක්ෂ වෙනුවෙන් හෝ වෙනත් පක්ෂයක අපේක්ෂකයන් වෙනුවෙන් ප්‍රචාරක කටයුතු සඳහා භාවිත කළ නොහැක. එනම් යම් පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක මැතිවරණ ප්‍රචාරක කාර්යාලවල වෙනත් පක්ෂවල ඡන්ද ලකුණු, වෙනත් පක්ෂවල අපේක්ෂකයන්ගේ නම්, ඡායාරූප, මනාප අංක යනාදිය ප්‍රදර්ශනය කළ නොහැක.

- යම් පක්ෂයකින් හෝ ස්වාධීන කණ්ඩායමකින් තරග කරන අපේක්ෂකයන්ට වෙනත් පක්ෂයක හෝ කණ්ඩායම්වල ඡන්ද පොළ නියෝජිතයන්/ ඡන්ද ගණන් කිරීමේ නියෝජිතයන් ලෙස කටයුතු කළ නොහැක.

- යම් පක්ෂයකින් හෝ ස්වාධීන කණ්ඩායමකින් තරග කරන අපේක්ෂකයකුට වෙනත් පක්ෂයක් ප්‍රවර්ධනය කිරීම සඳහා හෝ ස්වකීය පක්ෂයේ/ කණ්ඩායමේ නොවන අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රචාරක කටයුතු සිදුකිරීම, මාධ්‍ය නිවේදන නිකුත් කිරීම, දැන්වීම් පළ කිරීම කළ නොහැක.

- ලබාගෙන ඇති ඡන්ද සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම නිසා යම් පක්ෂයකට හෝ කණ්ඩායමකට මන්ත්‍රීධුර හිමිව නැත්නම් එම පක්ෂයේ හෝ කණ්ඩායමේ මනාප ගණන් කිරීමෙන් පසු එකී පක්ෂයේ/ කණ්ඩායමේ නියෝජිතයන් ගණන් කිරීමේ ශාලාවෙන් බැහැර කරනු ලබන බැවින් වෙනත් පක්ෂවල මනාප ගණන් කිරීම නිරීක්ෂණය කිරීමට, එවැනි අඩු ඡන්ද සංඛ්‍යාවක් ලබාගන්නා සැබෑ ලෙස තරග නොකරන පක්ෂවල/ කණ්ඩායම්වල නියෝජිතයන්ට අවකාශයක් නොලැබෙනු ඇත.

- **එහෙයින් සැබෑ ලෙස තරග කිරීමේ අපේක්ෂාවෙන් තොරව එනම් වෙනත් දේශපාලන පක්ෂවලට හෝ අපේක්ෂකයන්ට සහාය දැක්වීම සඳහා දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් හරහා නාමයෝජනා භාරදීම මඟින් අපේක්ෂිත පරිදි වෙනත් පක්ෂයකට හෝ වෙනත් පක්ෂ අපේක්ෂකයකුට සහාය ලබාදීමට කිසිදු හැකියාවක් නොලැබෙන බව, එසේ සහාය දීමේ අපේක්ෂාව සඳහාම පමණක් තරග කිරීමට සූදානම්ව සිටින සියලුම දෙනා වෙත කාරුණිකව අවධාරණය කරනු ලැබේ.**


මහින්ද දේශප්‍රිය
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.


2020.03.14